මගේ ආදරණීය නිලදරු කැල වෙත සෙනෙහසින්,

වහින්නට හැකිනම් ගිගුම් දී
වියළි ගම් බිම්වලට ඉහළින්
ඉදෙන්නට හැකිනම් බතක් වී
බතක් නොයිදෙන පැළක රහසින්

රුදෙන්නට හැකි නම් ළමා කැළ
හඩන දෙතොලක සිනාවක් වී
පිපෙන්නට හැකිනම් තුරින් තුර
නෙළාගත හැකි වන මලක් වී

නිදන්නට හැකි නම් දෙනෙත් තුළ
සැබෑවන සුබ සිහිනයක් වී
ගැයෙන්නට හැකි නම් දොරින් දොර
ලොවම පුබුදන ගීතයක් වී

සුනිල් ආරියරත්නයන් පද රචනය කළ, සුනිල් දයානන්දයන් සංගීතවත් කළ, නන්දා මාලිනීයන් ගායනා කරන ඒ ගීතය මිනිස් බල හා රැකියා අමාත්‍යාංශයේත් සමස්ත රාජ්‍ය ක්ෂේත්‍රයේත් සියළු නිලදරුවන්ගේ තේමා ගීතය විය යුතුයැයි මම විශ්වාස කරමි.

දස මසක් මව් කුසක පහස ලැබ ඉතා දුර්ලභ මනුසත්බවක් ලැබ විධිමත් දැනුමේ උපරිමයකට පැමිණ මිලියන 21.3ක ශ්‍රී ලාංකීය මිනිසුන්ගෙන් මිලියන 1.6 කටත් වඩා වූ රාජ්‍ය සේවක කුලකයකට ඇතුළත්ව අනාගතය ගොඩනගන රටේ මානව සම්පතෙහි අත්තිවාරම තනන මිනිස් බල හා රැකියා අමාත්‍යාංශයේ කාර්යය මණ්ඩලයේ කෙනෙකු වීමට ලැබීම මම මෙම ස්වභාව ධර්මයෙන් ලද භාග්‍යයක් ලෙස සළකමි.

එවැනි පුණ්‍යවන්ත දිගු ගමනක අවසනෙහි එහි අග්‍ර ඵලය නෙළා නොගන්නේ නම් එය අතිශය අවාසනාවකි. එය අපේ පමණක් නොව රටේද රටවැසියන්ගේද පුරවැසියන්ගේද අවාසනාව වන්නේය.

අම්මාගේ තන පුඩුවෙන් ගලා ආ අප බිවූ කිරි බිඳුවල ණය ගෙවීමට මිළ කළ නොහැකි අමිල අවස්ථාවක් අපට ලබා දී ඇත.

සහෝදර ආදරණීය ඔබෙන් ගෞරවයෙන්, ආදරයෙන්, භක්තියෙන් මම ඉල්ලන්නේ සත පහක්වත් වියදම් නොකර හිත හදා ගැනීම මත පමණක් මුළු විශ්වයම අප සතු කර ගත හැකි සරලම සරල කාරණා කිහිපයක් පමණි.

- හෘද සාක්ෂියට එකඟව වැඩ කරමු
- මානව දයාව, මෙත් ගුණ පතුරමු.
- යතාර්ථය දකිමු.
- මානව බැඳීම් තහවුරු කරමු.
- රාජකාරිය දේවකාරිය කර ගනිමු.
- අපේ සේවාලාභීන්ගේ අයිතිවාසිකම්, වරප්‍රසාද, හිමිකම් අනුග්‍රහ සහ ප්‍රතිලාභ වෙනුවෙන් පෙනී සිටිමු.
- සැගවුණු අරමුණු, සැගවුණු න්‍යාය පත්‍රවලින් තොරව සත්භාවයෙන් වැඩ කරමු.

නිදහස් අධ්‍යාපනයෙන් ඉගෙනගත් අපි සෑම මසකම 25 වෙනිදා හෝ ඊට පෙර අපේ වැටුප ලබන අපි, සියළු වරප්‍රසාද හා ප්‍රතිලාභ ලබන අපි, ඒ සියල්ල කිසිඳු මැසිවිල්ලකින් තොරව අපට ලබාදුන් හා ලබාදෙන පාරේ සිහමන් යදින යාචකයාගේ සිට රටේ අතිගරු ජනාධිපතිවරයා දක්වා ගෙවනු ලබන බඳු මුදලින් යැපෙන අපි, අපිට පැවරුණු කාර්යය විනිවිදභාවයේ, ඵලදායීතාවයේ, සමානාත්මතාවයේ, සමරුපීතාවයේ පෙර දැක්මකින් දෝරෙගලන සෙනෙහසකින් අවංකව හෘදසාක්ෂියට එකඟව අප නොකළොත් මේ සොබාදහමට ඒ අකාරුණික කම කෙසේ විඳදරා ගනීද?

විශ්ව ශක්තියේ ආශිර්වාදය මොන තරම් අපූරුද? එය අත්විඳි අයෙක්ම පමණයි එහි නිරාමිස සුවය දන්නේ. ඊට හොඳම උදාහරණයක් අපි අභිමුව සිටියි. ඒ වෙන කවරෙකු හෝ නොව අපේ ආදරණීය ලේකම්තුමයි. එතුමා සමඟ රාජකාරි කිරීමට මට ලැබුනු අවස්ථාව මගෙ ජීවිතයේ ලද උතුම්ම වාසනාවක් හා අවස්ථාවක් ලෙස සලකමි.

මේ වන විට රටේ මානව සම්පත පිළිබඳවත් රටේ සමස්ත දියුණුව පිළිබඳවත් අවංකව සිතන, පතන ඒ අනුව වැඩ කරන නායකයෙක් අපට සිටියි. අමාත්‍යාංශයේ ගරු ඇමතිතුමාද අභිමානවත්, ශක්තිමත්, ආදර්ශවත් නායකත්වයක් අපට ලබා දෙයි. අවශ්‍ය වන්නේ අපේ සැබෑ සූදානම සහ මැදිහත්වීම පමණි.

සම සිඳ මස්, මස් සිඳ ඇට, ඇට සිඳ ඇට මිදුළු දක්වා මනුස්සකම ලියලා දළුලා වැඩෙන්න ඉඩ හරින්න.සැබෑ මනුස්සකම තුළ අපට ජයගත නොහැකි ඉලක්කයක් නොමැත.

අපේ අමාත්‍යාංශය හරහා මේ වැඩ බිමේ සංස්කෘතිය වෙනස් කිරීමට මැදිහත්වන්න.

මේ ලෝකෙ අඩුවෙන්ම දන්න කෙනා තමන් යැයි සිතූ විට හැම මොහොතකම හැම තත්පරයකම අපට බොහෝ දෑ ඉගෙන ගත හැකිය. මම අදටත් මේ මොහොතේත් සනීපාරක්ෂක කම්කරුවාගෙන්ද කනිෂ්ඨ සේවකයාගෙන්ද ඉගෙන ගනිමි.

මට ඔබට පොත් ගණන් ලිවිය හැකිය. එය අවැසි නැත. ඔබ සබුද්ධිකය.

ඔබ මහපොළොව වෙනුවෙන් සිදු කරන ඉටු කරන යහපත් ඕනෑම දෙයක් වෙනුවෙන් මච්චත් බවින් යුතු සැබෑ නායකත්වයක් ලබා දීමට කැමති බව පවසමි.

ආදරණීය ඔබ සැමගේ පෞද්ගලික ජීවිතයත්, පවුල් ජීවිතයත්, වැඩ ජීවිතයත්, සමාජ ජීවිතයත් සෞභාග්‍යමත් වේවා !

අපි එකතුව මේ දේශය ගොඩනැගීමට හැකි උපරිමයෙන්ම කටයුතු කරමු.

හිතායු !

සුබායු !

දීඝායු !

අනූෂා ගෝකුල ප්‍රනාන්දු
අතිරේක ලේකම් (ආයතන)
2020.10.15